දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක **46/2014**

PH/CF/CA/2/APACACC/2014,

මුදල් අංශය,

බන්ධනාගාර මූලස්ථානය,

කොළඹ 09.

2014-11-27

සියළුම කොමසාරිස්වරුන්,

සියළුම මාණ්ඩලික නිළධාරීන්,

සියළුම බන්ධනාගාර අධිකාරීවරුන්, සහකාර අධිකාරීවරුන්.

**2014 වර්ෂය සඳහා ගිණුම් පියවීම**

2014 වර්ෂය සඳහා ගිණුම් පියවීම සම්බන්ධව රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක 20238/2014 හා 2014-11-04 දිනැති චක්‍රලේඛය හා භාණ්ඩාගාර මෙහෙයුම් අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක TO/DCM/CLOCB/2014 හා 2014-11-20 දිනැති භාණ්ඩාගාර මෙහෙයුම් චක්‍රලේඛය සම්බන්ධවයි. අදාල චක්‍රලේඛ www.treasury.gov.lk යන වෙබ් අඩවියට පිවිසීමෙන් ඔබට ලබාගත හැක. එම චක්‍රලේඛ අනුව බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ ගිණුම් පියවීමේ කටයුතු පහත උපදෙස් පරිදි සිදු විය යුතු බව අවධාරණය කරනු ලැබේ.

**01. 2014 දෙසැම්බර් මාසය සඳහා ප්‍රතිපාදන හා අක්මුදල් ලබා ගැනීම.**

i. බන්ධනාගාර දෙපාර්තමේන්තුව සඳහා 2014 වර්ෂය වෙනුවෙන් වෙන් කරන ලද ප්‍රතිපාදන, වැය විෂයන් කිහිපයකම මේ වන විට අවසන්ව ඇති බැවින් ලබාගත් අත්තිකාරම් නිරවුල් කිරීමට ප්‍රමුඛතාවය ලබා දෙමින් අවශ්‍ය ප්‍රතිපාදන ඉල්ලුම් කිරීමට සියළුම බන්ධනාගාර ආයතන ප්‍රධානින් වග බලා ගත යුතුය.

ii. 2014 දෙසැම්බර් මාසය සඳහා ඔබ ආයතනයට ලබා දෙන ප්‍රතිපාදන සීමාව ඉක්මවා ( ඒ ඒ වැය විෂයන් වලට අදාලව) කිසිදු ගෙවීමක් නොකිරීමට ආයතන ප්‍රධානීන් වග බලාගත යුතුය. යම් හෙයකින් දෙසැම්බර් මාසය සඳහා ලබා දෙන ප්‍රතිපාදන හෝ අක් මුදල් ඉතිරි වන්නේ නම් ඒ පිළිබඳව කඩිනමින් බන්ධනාගාර කොමසාරිස් (මුදල්) වෙත විද්‍යුත් තැපැල් (commfinance@prisons.gov.lk) මගින් හෝ ෆැක්ස් මගින් දැනුම් දීමට කටයුතු කල යුතුය.

iii. දෙපාර්තමේන්තුව සතු ප්‍රතිපාදන හා අක් මුදල් ප්‍රමාණය සැලකිල්ලට ගෙන නිරවුල් කල හැකි සියළුම බිල්පත් නිරවුල් කිරීමට දෙපාර්තමේන්තුවේ සියළුම නිළධාරීන් වග බලා ගත යුතු අතර, ලබා දී ඇති සියළුම අත්තිකාරම් නිරවුල් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කල යුතුය. වෙන් කරන ලද ප්‍රතිපාදන සීමාව ඉක්මවා වියදම් නොදැරීමටත්, වෙන් කරන ලද ප්‍රතිපාදන ඉතිරි නොවන ලෙස වියදම් කිරීමටත් කටයුතු කල යුතුය.

iv. 2014 වර්ෂයට අදාල සියළුම ගෙවීම් වවුචර අදාල සැපයුම්කරුගෙන් වර්ෂය අවසන් වීමට පෙර ගෙන්වා ගැනීමට අදාල නිලධාරීන් කටයුතු කල යුතුය. එම වවුචර ගිණුම් අංශ වෙත නොපමාව ලබා දීමට අදාල අංශ ප්‍රධානීන් කටයුතු කල යුතුය. මේ පිළිබඳව අදාල සැපයුම්කරුවන්ට ලිඛිතව දැනුම් දීමට පියවර ගත යුතුවේ.

**02. 2014 දෙසැම්බර් 31 දිනට මුදල් පොත පියවීම.**

i. සියළුම බන්ධනාගාර ආයතනවල 2014 දෙසැම්බර් 31 දිනට පෙර ගමන් වියදම්, ඉන්ධන අත්තිකාරම් හා සුළු අක්මුදල් ඇතුළු සියළුම අත්තිකාරම් සම්පූර්ණයෙන් පියවා ගැනීමට කටයුතු කල යුතුය. දෙසැම්බර් මස අවසන් සති දෙක තුල අත්‍යවශ්‍ය කරුණකට හැර අග්‍රිම අත්තිකාරම් ලබා නොදිය යුතුය.

ii. **2014-12-31** දිනට මුදල් පොතේ ඉතිරි ශේෂයේ වටිනාකම බන්ධනාගාර කොමාසාරිස් ජනරාල්ගේ බොරැල්ල ලංකා බැංකු ශාඛාවේ ගිණුම් අංක **7041491** ට චෙක්පතක් ලියා මුදල් පොත ශූන්‍ය කළ යුතුය. එම චෙක්පතේ ඡායා පිටපතක් විද්‍යුත් තැපැල (commfinance@prisons.gov.lk) මගින් හෝ ෆැක්ස් මගින් බන්ධනාගාර කොමසාරිස් (මුදල්) වෙත එදිනම ප.ව **02.00** ට පෙර එවීමට කටයුතු කල යුතුය. මුදල් පොතේ ශේෂයක් නොමැති නම් ඒ පිළිබඳව ලිඛිතව දැනුම් දීමට ඉහත පරිදි කටයුතු කල යුතුය.

iii. බන්ධනාගාර ආයතන වල ගිණුම් පියවීම සම්බන්ධව බලය පැවරූ නිලධාරීන්ගේ නාම ලේඛණය ඇමුණුම් 01 හි දක්වා ඇත. අදාල නිළධාරීන් ඒ ඒ ආයතන වල මුදල් පොත වැසීමේ වගකීම දැරිය යුතුය. 2014-12-31 දිනෙන් පසු කිසිදු ගෙවීමක් මුදල් පොතේ සටහන් කල නොහැකි වන පරිදි එක් එක් මුදල් පොත්වල එදිනට සටහන් කෙරෙන අවසාන සටහනට යටින් රතු තීන්තෙන් ඉරක් ඇඳ තම නම, තනතුර, අත්සන, දිනය හා වේලාව සටහන් කර 2014 වර්ෂයේ මුදල් පොත නියමිත පරිදි වැසූ බවට සටහන් තැබිය යුතුය.

iv. 2015 වර්ෂය සඳහා අවශ්‍ය අක් මුදල් බන්ධනාගාර මූලස්ථානය මගින් ලබා දෙන බැවින් කිසිදු අග්‍රිම ශේෂයක් බන්ධනාගාර ආයතන විසින් රඳවා තබා ගැනීමට කටයුතු නොකල යුතුය.

**03.** මාසික ගිණුම් ප්‍රකාශන ඉදිරිපත් කිරීම.

i. 2014 දෙසැම්බර් මස ගිණුම් සාරාංශය 2015-01-06- වන දිනට පෙර ලබා දිය යුතුය. පළමු වන ගිණුම් සාරාංශයේ යම්කිසි ගිණුම්කරණ දෝෂයක් නිවැරදි කිරීම හෝ හරස් සටහන් මගින් කරනු ලබන ගෙවීමක් ගිණුම්ගත කිරීමට ඇත්නම් ඒ සඳහා පරිපූරක ගිණුම් සාරාංශයක් ඉදිරිපත් කල හැක.පරිපූරක ගිණුම් සාරාංශය 2015-01-13 වන දිනට පෙර ලබා දිය යුතුය.

ii. ගිණුම් පියවීමේ කටයුතු සම්බන්ධව යම් පැහැදිලි කරගැනීමක් වෙතොත් බන්ධනාගාර කොමසාරිස් (මුදල්) අමතන මෙන් කාරුණිකව දන්වමි. කාර්මික හා කෘෂිකාර්මික ගිණුමට අදාලව ගිණුම් හා මුදල් පොත පියවීම සම්බන්ධව වෙනමම චක්‍රලේඛයක් නිකුත් කර ඇති බව වැඩි දුරටත් දන්වමි.

චන්ද්‍රරත්න පල්ලේගම

බන්ධනාගාර කොමසාරිස් ජනරාල්

චන්ද්‍රරත්න පල්ලේගම
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්
බන්ධනාගාර මූලස්ථානය,
කොළඹ 09.

පිටපත:- 01. විගණකාධිපති - දැ.ගැ.පි

02. බන්ධනාගාර කොමසාරිස් (අභ්‍යන්තර විගණන) - අ.ක.ස

( ඇමුණුම 01 )

2014 වර්ෂයේ ගිණුම් පියවීම සඳහා බලය පැවරූ නිලධාරීන්ගේ නාම ලේඛණය

**බන්ධනාගාර දෙපාර්තමේන්තුව**

| # | # | නිලධාරියාගේ නම | තනතුරු නාමය | ආයතනය |
|---|---|---|---|---|
| 1 | BC | එච්.සී.ඩබ්. කාරියවසම් | බන්ධනාගාර කොමසාරිස් මුදල් | මූලස්ථානය |
| 2 | B1 | එල්.එච්.ටී. රංජන් | බන්ධනාගාර අධිකාරී | වැලිකඩ |
| 3 | B2 | කේ.ඒ.කේ.එස්.එන්.කේ. කළුආරච්චි | බන්ධනාගාර අධිකාරී | කොළඹ රිමාන්ඩ් |
| 4 | B3 | කේ.කේ.එස්.යූ. රන්ජන් | බන්ධනාගාර අධිකාරී (වැ.ආ) | මැගසින් |
| 5 | B4 | ටී.අයි. උඩුවර | බන්ධනාගාර අධිකාරී (වැ.ආ) | මහර |
| 6 | B5 | ටී.එම්.ජේ.සී.එල්.බී. ඒකනායක | බන්ධනාගාර අධිකාරී (වැ.ආ) | ප.වි.පු.ම |
| 7 | B6 | කේ.ඒ.එස්. කොඩිතුවක්කු | සහකාර බන්ධනාගාර අධිකාරී | මීගමුව |
| 8 | B7 | එච්.ඒ.එම්.එස්.බී. සේනානායක | බන්ධනාගාර අධිකාරී (වැ.ආ) | මහනුවර |
| 9 | B8 | ජී.එම්.පී. ලියනගේ | බන්ධනාගාර අධිකාරී (වැ.ආ) | පල්ලේකැලේ |
| 10 | B9 | එච්.ඒ.සී. පෙරේරා | සහකාර බන්ධනාගාර අධිකාරී (වැ.ආ) | යාපනය |
| 11 | B10 | එල්.ජේ.එම්.කේ. බණ්ඩාර | සහකාර බන්ධනාගාර අධිකාරී (වැ.ආ) | අනුරාධපුරය |
| 12 | B11 | එස්.ආර්. ගලප්පත්ති | සහකාර බන්ධනාගාර අධිකාරී (වැ.ආ) | බදුල්ල |
| 13 | B12 | එල්.එම්.එස්. බණ්ඩාර | සහකාර බන්ධනාගාර අධිකාරී | තල්දෙන |
| 14 | B13 | එස්.එච්.වී. ප්‍රියන්කර | සහකාර බන්ධනාගාර අධිකාරී (වැ.ආ) | මඩකලපුව |
| 15 | B14 | ජේ.සී. වීරසිංහ | සහකාර බන්ධනාගාර අධිකාරී (වැ.ආ) | ගාල්ල |
| 16 | B15 | කේ.ඩබ්.එස්. ධම්මික | සහකාර බන්ධනාගාර අධිකාරී (වැ.ආ) | මාතර |
| 17 | B16 | ආර්.ඩබ්.ඩබ්.යූ.ඩී.ඒ. සම්පායෝ | සහකාර බන්ධනාගාර අධිකාරී (වැ.ආ) | වීරවිල |
| 18 | B17 | ඩබ්.ඒ.ඩී.සී. කරුණාසේකර | සහකාර බන්ධනාගාර අධිකාරී (වැ.ආ) | තංගල්ල |
| 19 | B19 | එස්.ආර්. ජයවීර ද සිල්වා | සහකාර බන්ධනාගාර අධිකාරී (වැ.ආ) | කුරුවිට |
| 20 | B20 | ඩී.ආර්.ඩී. දසනායක | සහකාර බන්ධනාගාර අධිකාරී (වැ.ආ) | දළුපොත |
| 21 | B21 | යූ.ජී.ඩබ්. තෙන්නකෝන් | සහකාර බන්ධනාගාර අධිකාරී (වැ.ආ) | ත්‍රිකුණාමලය |
| 22 | B22 | එස්.කේ. පල්ලේතැන්න | සහකාර බන්ධනාගාර අධිකාරී (වැ.ආ) | කළුතර |
| 23 | B23 | ආර්.එස්. අලහකෝන් | සහකාර බන්ධනාගාර අධිකාරී (වැ.ආ) | කෑගල්ල |
| 24 | B24 | සී. ලියනගේ | සහකාර බන්ධනාගාර අධිකාරී (වැ.ආ) | බූස්ස |
| 25 | B25 | කේ.ඒ.එෆ්.එල්.පී. ගුණවර්ධන | සහකාර බන්ධනාගාර අධිකාරී (වැ.ආ) | වටරැක |
| 26 | B26 | ඒ.එම්.එම්. අලහකෝන් | සහකාර බන්ධනාගාර අධිකාරී (වැ.ආ) | වාරියපොළ |
| 27 | B27 | ඩී.ඒ.එම්.එන්. ශාන්ත | සහකාර බන්ධනාගාර අධිකාරී (වැ.ආ) | මොණරාගල |
| 28 | B28 | පී.එච්.එම්.කේ.එම්. අබේරත්න | සහකාර බන්ධනාගාර අධිකාරී (වැ.ආ) | පොළොන්නරුව |
| 29 | B29 | එම්.එච්.ආර්. අජිත් | සහකාර බන්ධනාගාර අධිකාරී (වැ.ආ) | අඟුණකොළපැලැස්ස |

* යම් හෙයකින් ඉහත බලය පැවරූ නිලධාරියෙකු ස්ථාන මාරු නියෝගයක් මත බන්ධනාගාර ආයතනය මාරු වන්නේනම් ස්ථාන මාරු නියෝගය අනුව කටයුතු කල යුතුය.